OL/2025(2026)/43-S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

| 43 | S | I |
|---|---|---|

| පත්‍රය | ලකුණු |
|---|---|
| I | |

| | |
|---|---|
| පරීක්ෂක 1 | |
| පරීක්ෂක 2 | |
| EMF | |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

| | |
|---|---|
| චිත්‍ර | I |
| சித்திரம் | I |
| Art | I |

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

- සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

විභාග අංකය : ......................................

- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක **1** සිට **5** තෙක් දී ඇති ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



**1.** මෙම වාස්තු විද්‍යා නිර්මාණය ................................................ යුගයට අයත් ය.

**2.** මෙය පිහිටා ඇත්තේ ................................................ විහාර භූමියේ ය.

**3.** මෙම සුවිශේෂී වාස්තු නිර්මාණ අංගය ................................................ නමින් හැඳින්වේ.

**4.** මෙහි බිම් මහලේ සතර දිශාවට මුහුණලා කැටයම් කර ඇති ................................................ අටකි.

**5.** මහල් දෙකකින් යුතු මෙහි බිම් මහලේ හතර දිශාවට මුහුණලා ඉදිකර ඇති ................................................ හතරකි.

- අංක **6** සිට **10** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**6.** මහනුවර දළදා මැදුරේ දේවේන්ද්‍ර මූලාචාරී ශිල්පියා විසින් නිර්මිත සුවිශේෂී වාස්තු නිර්මාණ අංගය කුමක්ද?

................................................................................................

**7.** මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා සීගිරිය හැඳින්වූයේ කුමන නමකින් ද?

................................................................................................

[දෙවැනි පිටුව බලන්න.

**8.** ඩබ්. ආර්. විජේසෝම කාටූන් ශිල්පියා විසින් නිර්මාණය කරන ලද වඩාත් ම ජනප්‍රිය කාටූන් චරිතය කුමක්ද?

...............................................................................................................

**9.** නටරාජා පිළිරුවේ පාදයෙන් වාමනයෙකු පාගාගෙන සිටීමෙන් සංකේතවත් වන්නේ කුමක්ද?

...............................................................................................................

**10.** පොළොන්නරු ගල් විහාරයේ බුදුපිළිමවල චීවරයේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණය කුමක් ද?

...............................................................................................................

● අංක **11** සිට **15** තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා, **ඊට යටින් ඉරක් අඳින්න.**

**11.** අනුරාධපුර මහමෙවුනා උයනේ පිහිටා ඇති සමාධි පිළිමය,
- (1) ධ්‍යාන මුද්‍රාවෙන් වැඩ හිඳින අවස්ථාව නිරූපණය කරයි.
- (2) වීරාසන ක්‍රමයෙන් හා ධ්‍යාන මුද්‍රාවෙන් නෙළන ලද්දකි.
- (3) ඒකාංශ කළ අයුරින් නෙළූ චීවරයකින් සමන්විත ය.
- (4) ඉන්දීය කලා ලක්ෂණ නිරූපණය කරයි.

**12.** ගම්පොළ යුගයේ ලංකාතිලක විහාරයේ බුදු පිළිමය නිර්මාණයේ දී ශිල්පියා උත්සහ දරා ඇත්තේ,
- (1) වීරාසන ක්‍රමය හා ධ්‍යාන මුද්‍රාව නිරූපණයට ය.
- (2) උෂ්ණීෂය මත සිරස්පත නිර්මාණය කිරීමට ය.
- (3) අධ්‍යාත්මික ගුණ සමුදායකට වඩා බාහිර ලක්ෂණ පෙන්වීමට ය.
- (4) මල් ලියකම්වලින් සපිරි මකර තොරණ නිර්මාණයට ය.

**13.** ඉන්දීය අජන්තා චිත්‍රවල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,
- (1) සකසාගත් බදාමයක් මත සිතුවම් කර තිබීමයි.
- (2) ජාතක කතා හා බුද්ධ චරිතය පමණක් වස්තු විෂය කර ගැනීමයි.
- (3) සීගිරියේ අප්සරා රූපවලට සමානව ඇඳ තිබීමයි.
- (4) තේමාවන් තීව්‍ර කිරීම සඳහා අඳුරු හා දීප්තිමත් වර්ණ භාවිතයයි.

**14.** හෙන්රි මුවර්ගේ වැතිර සිටින කාන්තාව නම් වූ මූර්තියේ විශේෂත්වය වූයේ,
- (1) මූර්ති නිර්මාණයේ මූලධර්ම භාවිතයෙන් නිර්මාණය කළ උද්‍යාන මූර්තියක් වීම ය.
- (2) දිගටි හැඩ රිද්මානුකූලව භාවිත කළ මූර්තියක් වීම ය.
- (3) ස්වාභාවිකත්වයෙන් තොරව නිර්මාණය කළ මූර්තියක් වීම ය.
- (4) මානව සිරුරේ මූලික හැඩය ව්‍යුක්තරූපීව යොදා කළ උද්‍යාන මූර්තියක් වීම ය.

**15.** පොළොන්නරුවේ අංක 02 ශිව දේවාලය,
- (1) දකුණු ඉන්දීය වාස්තු නිර්මාණ ලක්ෂණ අනුව ඉදිවූවකි.
- (2) ක්‍රි.ව.13 වැනි සියවසේ ඉන්දීය වාස්තු නිර්මාණ ලක්ෂණ අනුව ඉදිකරන ලද්දකි.
- (3) පොළොන්නරුවේ ප්‍රථමයෙන් ම ඉදි වූ හින්දු දෙවොල ය.
- (4) ක්‍රි.ව.10 වැනි සියවසේ චෝල වාස්තු නිර්මාණ ලක්ෂණ අනුව ඉදිවූවකි.

● අංක **16** සිට **20** තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

**16.** හර්මිකා : ...............................................................................................................

...............................................................................................................

**17.** ගෝපුර : ...............................................................................................................

...............................................................................................................

**18.** ටෙම්පරා : ...............................................................................................................

...............................................................................................................

**19.** කියරොස්කුරෝ : ...............................................................................................................

...............................................................................................................


**20.** පර්යාලෝකය : ...............................................................................................................

...............................................................................................................

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- අංක **21** සිට **25** තෙක් දී ඇති රූප සටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූප සටහන, ඉදිරියෙන් ඇති **A, B, C, D** සහ **E** යන ඒවා අතුරෙන් තෝරා, එහි අක්ෂරය **තිත් ඉර මත** ලියන්න.

**21.**  (.........)  **A**

**22.**  (.........)  **B**

**23.**  (.........)  **C**

**24.**  (.........)  **D**

**25.**  (.........)  **E**

- අංක **26** සිට **30** තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු **වචනය/වචන** යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

**26.** ජේසුස් වහන්සේ තම අනුගාමිකයන් දොළොස්දෙනා හමුවන අවස්ථාව ........................................................ සිතුවම තුළින් නිරූපණය වේ.

**27.** ඉන්දු නිම්නයෙන් හමු වූ පශුපති මුද්‍රාව ශිවගේ මූලාදර්ශයක් බව පුරාවිද්‍යාඥ ........................................................ ........................................ පවසයි.

**28.** නියපොතු වැඩ හා පට්ටල් වැඩ යන ශිල්පීය ක්‍රම භාවිත වන්නේ ........................................ කලා කර්මාන්තයේ ය.

**29.** මයිකල් ආන්ජිලෝ ශිල්පියා විසින් සිස්ටයින් දෙව් මැදුරේ අල්තාරය පිටුපස බිත්තියේ අඳින ලද .................................... සිතුවම විශිෂ්ට නිර්මාණයකි.

**30.** බුදුන් වහන්සේ තව්තිසා දෙව්ලොවට වැඩම කර දහම් දෙසා ආපසු එන ගමන, දැක්වෙන සිතුවම ........................................................... නමින් හැඳින්වේ.

- අංක **31** සිට **35** තෙක් දී ඇති ප්‍රශ්නවල හිස්තැන් **F, G, H, I, J** යන රූප සටහන් ඇසුරෙන් පුරවන්න.


F


G


H


I


J

**31.** **F** අක්ෂරයෙන් දැක්වෙන නෙළුම් ශාකයේ හැඩය ගත්, කුලුණු සහිත මණ්ඩපය හැඳින්වීමට යොදා ගත් නම කුමක් ද? ..............................

**32.** **G** අක්ෂරයෙන් දැක්වෙන කැටයම නිර්මාණයේ දී භාවිත කළ ශිල්ප ක්‍රමය කුමක් ද?

..............................

**33.** **H** අක්ෂරයෙන් දැක්වෙන මෙම කාන්තා රුව හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?

..............................

**34.** **I** අක්ෂරයෙන් දැක්වෙන ඒ. මාර්ක් ශිල්පියා විසින් නිර්මාණය කරන ලද 'සකුන්තලා' සිතුවම කුමන යුරෝපීය කලා ප්‍රවණතාවක ශෛලීය ලක්ෂණ ආභාස වී තිබේ ද?

..............................

**35.** **J** අක්ෂරයෙන් දැක්වෙන පන්කුලිය පිළිමයෙන් පිළිඹිබු වන්නේ කුමන කලා ලක්ෂණ ද?

..............................

- ඔබට සපයා ඇති වර්ණ චිත්‍රය ඇසුරෙන් එහි තොරතුරු හා කලාත්මක අගය විග්‍රහ වන පරිදි අංක **36** සිට **40** තෙක් දී ඇති උප මාතෘකා යටතේ අර්ථවත් වාක්‍ය **පහක්** ලියන්න. (පිළිතුරු විස්තරාත්මක වාක්‍යයකින් දැක්වීම අනිවාර්යය වේ. එසේ නොමැති පිළිතුරු සඳහා ලකුණු **නොලැබේ**.)

**36.** ශිල්පියා : ..............................

..............................

**37.** තේමාව : ..............................

..............................

**38.** සංරචනය : ..............................

..............................

..............................

**39.** සිද්ධාන්ත භාවිතය : ..............................

..............................

..............................

**40.** හැඟීම් ප්‍රකාශනය : ..............................

..............................

..............................

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

චිත්‍ර II
சித்திரம் II
Art II

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස් :**

- ✳ ඔබේ **විභාග අංකය** උත්තර පත්‍රයේ ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ පැහැදිලි ව ලියන්න.
- ✳ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට දුව මාධ්‍ය භාවිතා කරන ලද සිතුවම් වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇළී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- ✳ දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි ය.
- ✳ ද්‍රව්‍ය සමූහය 73 cm පමණ උස පැතැලි ඩෙස්ක් එකක් මත තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත.

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

✳ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා ඔබට සපයා ඇති A4 ප්‍රමාණයේ සුදු කඩදාසිය භාවිත කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ, වර්ණ කරන්න. මේ සඳහා සපයා ඇති විශේෂ චිත්‍ර ඇඳීමේ කඩදාසිය භාවිත කරන්න.

✳ **ඉහත 1 සහ 2 චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.**

✳ ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- **නිදහස් රේඛා අධ්‍යයනය**

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව රේඛා අධ්‍යයනයේදී දක්වා ඇති කුසලතා (ලකුණු 05)

- **වර්ණ චිත්‍රය**

2. ද්‍රව්‍ය සමූහය, තලය මත අර්ථවත්ව සංරචනය කිරීමේ හැකියාව (ලකුණු 05)
3. ද්‍රව්‍යයන්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව (ලකුණු 05)
4. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (ලකුණු 05)
   (පර්යාවලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මටට්ම, අවකාශ භාවිතය)
5. වර්ණ භාවිතය හා ගතිලක්ෂණ දැක්වීම (ලකුණු 05)
6. චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ත නිමාව (ලකුණු 05)

**සැලකිය යුතුයි:**

✳ ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල සම්පූර්ණයෙන්ම ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

✳ ✳ ✳

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 S III**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

| | |
|---|---|
| චිත්‍ර III<br>சித்திரம் III<br>Art III | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

**උපදෙස් :**

* ඔබ ඇඳිය යුත්තේ **එක්** වර්ණවත් චිත්‍රයක් පමණි.
* ඔබේ **විභාග අංකය** හා අදාළ **ප්‍රශ්න අංකය** උත්තර පත්‍රයේ නියම කර ඇති ස්ථානයේ පැහැදිලි ව ලියන්න.
* උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට චිත්‍රය සම්පූර්ණයෙන් වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇළී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
* දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැකි ය.
* චිත්‍ර ඇඳීමේ විශේෂ කඩදාසිය සමග A4 ප්‍රමාණයේ රළු කඩදාසියක් සහ ටිෂූ කඩදාසි සපයනු ලැබේ.

'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ **එක් ප්‍රශ්නයක් පමණක්** තෝරාගන්න.

**'අ' කොටස - චිත්‍ර සංරචනය**

1. උත්සව සමයේ ජනයාගෙන් පිරි පදික වෙළඳපොළ
2. චාරිකාවක දී දිය නාමින් විනෝද වන පිරිසක්
3. අනතුරක සේයා වැටුණු මුව රංචුවක්
4. අස්වනු නෙළන ගොවියෝ සහ ගෙවිලියෝ

**'ආ' කොටස - මෝස්තර නිර්මාණය**

5. ජ්‍යාමිතික හැඩතල ඇසුරෙන් සකසා ගත් මෝස්තර ඒකක භාවිතයෙන් අඟල් 9" × 9" ප්‍රමාණයේ **ව්‍යාප්ත මෝස්තරයක්** ඇඳ වර්ණ කරන්න.
6. සත්ත්ව හා තුරුලතා හැඩ යොදා අඩි 10' × 6' ප්‍රමාණයේ **බිත්ති සැරසිල්ලක්** සැලසුම් කර වර්ණ කරන්න. (පරිමාණුකූලව තලයට ගලපන්න.)
7. සංචාරක හෝටලයක ආලින්දයේ එල්ලීම සඳහා සුදුසු **පතාකයක්**, සාම්ප්‍රදායික උද්භිද හැඩතල ඇසුරෙන් සැලසුම් කර වර්ණ ගන්වන්න. (ප්‍රමාණය තලයට අනුරූපව ගලපන්න.)

**'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර**

8. ශ්‍රී ලංකාවේ අලි ඇතුන් සුරැකීමේ සංවිධානයකට උචිත **ලාංඡනයක්** (Logo) සැලසුම් කර වර්ණ ගන්වන්න. (ප්‍රමාණය අඟල් 6" × 6" වඩා වැඩි උචිත හැඩයකට ගලපන්න.)
9. දේශීය තේ කොළ ජාත්‍යන්තර වෙළඳපොලට අපනයනය කිරීම සඳහා සුදුසු **ඇසුරුමක්** ද්විමානව හෝ ත්‍රිමාණව සැලසුම් කර වර්ණ කරන්න.
10. ජලභීතිකා රෝගයෙන් ආරක්ෂා වීම පිළිබඳ දැනුවත්භාවය ප්‍රචලිත කිරීම සඳහා උචිත **පෝස්ටරයක්** සැලසුම් කර වර්ණ කරන්න.

***

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki
88126



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
**General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)**

**චිත්‍ර I / சித்திரம் I / Art I**

- ප්‍රශ්න අංක **36** සිට **40** දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත සිතුවම භාවිත කරන්න.

  வினா இலக்கம் **36** தொடக்கம் **40** வரையிலான வினாக்களுக்கு விடையளிப்பதற்கு கீழே தரப்பட்டுள்ள உருவப்படத்தினை பயன்படுத்துக.

  Use the following painting to answer the questions from No. **36** to **40**.




* * *


# 11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට




Rs : 300





Rs : 300




Rs : 300





Rs : 300





Rs : 300





Rs : 300




Rs : 350




Rs : 300




Rs : 300




Rs : 200





Rs : 200





Rs : 200





Rs : 250





Rs : 250





Rs : 200





Rs : 200




Rs : 200





Rs : 300





Rs : 300




Rs : 200




Rs : 200




Rs : 250





Rs : 650


මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE


## 11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180

**මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.**

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE